**ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය**

----------------------------

1. **මූල්‍ය ප්‍රකාශන**

----------------

1.1 **මතය**

-------

මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සහ මට සපයන ලද උපරිම තොරතුරු සහ පැහැදිලි කිරීම් අනුව, ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා නිස ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්, මෙම වාර්තාවේ 1.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් මූල්‍ය ප්‍රකාශන වලට වන බලපෑම හැර 2010 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයේ ක්‍රියාකාරීත්වය පිළිබඳ තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මෙහෙයුම් කටයුතු වල මූල්‍ය ප්‍රතිඵල හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති වලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බවත් මා දරන්නා වූ මතය වේ.

1.2 **මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

------------------------------------------

1.2.1 **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ ප්‍රමාදය**

------------------------------------------

2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 6.5.1 වගන්තිය අනුව මුදල් වර්ෂය අවසන් වී දින 60 ක් තුළ මූල්‍ය ප්‍රකාශන විගණනයට ඉදිරිපත් කළ යුතු වුවද, ආයතනයේ සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2011 මැයි 30 දින විගණනයට ඉදිරිපත් කරන ලදී.

1.2.2 **ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවලට අනුකූල නොවීම**

------------------------------------------------------

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත අංක 18 (77) ට අනුව යම් වත්කම් කාණ්ඩයක් ප්‍රත්‍යාගණිත වටිනාකමට මූල්‍ය ප්‍රකාශනවල දැක්වීමේදී හෙළිදරව් කළයුතු කරුණු ප්‍රධාන කාර්යාලයේ සහ බේරුවල ශාඛාවේ යන්ත්‍ර සූත්‍ර රු.6,535,149 කට ප්‍රත්‍යාගණනය කිරීම සම්බන්ධයෙන් හෙළිදරව් කර නොතිබුණි.

**1.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම.**

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන පහත සඳහන් විෂයයන් ඒ ඒ විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි නොවීම නිසා විගණනයේදී සතුටුදායක ලෙස සන්නිරීක්ෂණය කිරීමට හෝ පිළිගැනීමට හෝ නොහැකි විය.

| විෂයය | වටිනාකම රු. | නොසැපයූ ලිඛිත සාක්ෂි |
| --- | --- | --- |
| ස්ථාවර වත්කම් | 1,468,770 | වර්ෂයේ මිලදී ගැනීම් පිළිබඳ විස්තර |
| පාර්තෝෂික | 744,163 | උපලේඛනය |
| ගෙවිය යුතු වියදම් | 778,821 | අදාල ලියකියවිලි හා ගෙවීම් වවුචර් |
| ජ'නල සටහන් 1150 | - | උපලේඛනය |

**1.2.4 නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| **නීති, රීති , රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව** | **අනුකූල නොවීම** |
| --- | --- |
| (අ) 1971 අංක 38 දරන මුදල් පනතෙ 8(3) වගන්තිය සහ පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.1 වගන්තිය | 2009 හා 2010 වර්ෂයේ අයවැය ලේඛනයෙහි පුරෝකථනය කළ ශේෂපත්‍රයක් සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශයක් ඉදිරිපත් කර නොතිබුණි. |
| (ආ) පීඊඩී/12 හා 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය 5.2.5 වගන්තිය | අධ්‍යක්ෂ මණ්ඩලය අනුමත කරන ලද අයවැය ලේඛනයෙහි පිටපත් අදාල අමාත්‍යාංශයට, රාජ්‍ය ව්‍යවසාය දෙපාර්තමේන්තුවට, මුදල් අමාත්‍යාංශයට සහ විගණකාධිපති වෙත අදාල වර්ෂය ආරම්භයට දින 15 කට ප්‍රථම ඉදිරිපත් කළ යුතු වුවත්, ඒ අනුව කටයුතු කර නොතිබුණි. |

1.2.5 **අධිකාර් බලය නොලත් ගනදෙනු**

පාලක මණ්ඩල අනුමැතියකින් තොරව රු.10,000 ක මුදලක් පරිත්‍යාග කර තිබුණි.

2. **මූල්‍ය හා මෙහෙයුම් සමාලෝචනය**

2.1 **මූල්‍ය සමාලෝචනය**

2.1.1 **මූල්‍ය ප්‍රතිඵල**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2010 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ආයතනයේ මෙහෙයුම් කටයුතුවල ප්‍රතිඵලය රු. 4,412,259 ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 3,337,971 ක් වුයෙන් සමාලෝචිත වර්ෂයේ මූල්‍ය පතිඵලයේ රු. 1,074,288 ක වර්ධනයක් නිරීක්ෂණය විය.

| විස්තරය | විචලනය | | |
|---|---|---|---|
| | හිතකර | අහිතකර | |
| | රු. | රු. | රු. |
| ආදායම් | 660,531 | - | |
| වෙනත් මෙහෙයුම් ආදායම් | - | 1,336,195 | |
| ශාඛාවල ශුද්ධ අතිරික්තය/ ඌනතාවය | - | 21,531 | |
| පරිපාලන වියදම් | 1,845,361 | - | |
| මූල්‍ය හා වෙනත් වියදම් | - | 73,878 | |
| | 2,505,892 | 1,431,604 | 1,074,288 |

2.1.2 **ශාඛා වලින් සමස්ථ ලාභයට වන දායකත්වය අවම වීම**

ප්‍රධාන කාර්යාලයේ 2010 වර්ෂයේ ලාභය රු. 4,412,259 ක් වන විට මාතලේ ශාඛාවේ ලාභය රු.50,911 ක් සහ බේරුවල ශාඛාවේ අලාභය රු.96,618 ක් විය. ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනය විසින් පවත්වා ගෙන යනු ලබන මෙම ශාඛා දෙකෙන් ආයතනයේ සමස්ථ ලාභයට වන දායකත්වය ඉතාම අවම මට්ටමක පවතී.

2.2 **මෙහෙයුම් සමාලෝචනය**

---------------------------

2.2.1 **කාර්ය සාධනය**

-------------------

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

**(අ)** 2010 වර්ෂය සඳහා ප්‍රධාන කාර්යාලයට පාඨමාලා 22 ක් හා ශාඛාවලට පාඨමාලා 3 ක් සැලසුම් කර තිබුණු අතර සැලසුම් කල පාඨමාලා 08 ක් පවත්වා නොතිබුණි.

**(ආ)** 2010 වර්ෂයේ දී පැවැත්වීමට සැලසුම් කළ පාඨමාලාවන් 6 ක් සඳහා ශිෂ්‍යයන් 85 ක් බඳවා ගැනිමට අපේක්ෂා කර තිබුණද එම පාඨමාලා නොපැවැත්වීම නිසා අපේක්ෂිත ආදායම වු රු.2,761,000 ක් ලහාවී නොතිබුණි.

**(ඇ)** බේරුවල ශාඛාවේ 2010 වර්ෂයේ පැවැත්වු පාඨමාලා සඳහා අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාව 60 ක් වු අතර සත්‍ය වශයෙන් සහභාගී වු ශීෂ්‍ය සංඛ්‍යාව 33 කි. එය අපේක්ෂිත ශිෂ්‍ය සංඛ්‍යාවෙන් 55% කි. මේ අනුව 2009 වර්ෂයට සාපේක්ෂව ශිෂ්‍ය සංඛ්‍යාවේ අඩුවීම 208% ක් පමණ වේ.

2.2.2 **ප්‍රමාද වූ ව්‍යාපෘති**

-------------------

ශ්‍රී ලංකා මුද්‍රණ ආයතනයට නව ගොඩනැගිල්ලක් ඉදිකිරීම සඳහා 2004 දෙසැම්බර් 09 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී තිබු නමුත් වර්ෂ 05 ක් ඉක්මවා යනතුරුත් එහි ඉදිකිරීම් කටයුතු ආරම්භ කිරීමට නොහැකි වී තිබුණු අතර යෝජිත ඉඩම පවරා ගැනීමේ කටයුතු ද අවසන් කර නොතිබුණි.

2.2.3 **අනාර්ථික ගනුදෙනු**

-----------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) 2011 ජූලි 29 දින වන විටත් පිළියෙල කර නොතිබුණු සංයුක්ත සැලැස්ම පිළියෙල කිරීම සඳහා 2010 වර්ෂයේදී රු.65,000 ක ගෙවීම් සිදුකර තිබුණි.

(ආ) ගිණුම් සැකසමේ කටයුතු වරලත් ගණකාධිකාර සමාගමකට ගිවිසුමකින් තොරව ලබාදී තිබූ අතර ඒ සඳහා වර්ෂයකට රු. 102,747 ක් ගෙවා තිබුණි. නියමිත දිනයට මුල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කරද නොතිබුණි.

(ඇ) රු. 90,000 ක් වැයකර පෞද්ගලික ආයතනයකින් ලබාගත් කළමනාකරණ විගණන වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක වී නොතිබුණි.

**2.2.4 සංයුක්ත සැලැස්ම සහ එහි ක්‍රියාකාර්ත්වය.**

2003 ජුනි 2 දින හා අංක පීඊඩී /12 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 5.1 වගන්තිය ප්‍රකාර, සංයුක්ත සැලැස්මක් සකස් කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

**2.2.5 අයවැය ලේඛනමය පාලනය**

ප්‍රධාන කාර්යාලය, මාතලේ සහ බේරුවල ශාඛාවල සමාලෝචිත වර්ෂයට අදාලව විෂයයන් 10 ක් යටතේ අයවැයගත ප්‍රතිපාදන ඉක්මවා රු. 485,898 ක වියදමක් දරා තිබුණු අතර වැය විෂයයන් 13 ක් යටතේ රු.603,102 ක සහ රු. 22,723 ක අයවැයගත නොකල ආදායම් විය. ශාඛා කාර්යාලවල ඇස්තමේන්තුගත පාඨමාලා ආදායම රු. 558,250 කින් අඩුවී තිබුණි. මේ අනුව අයවැයගත හා තථ්‍ය වියදම් අතර සැළකිය යුතු විචලනයන් නිරීක්ෂණය වුයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරන පාලන කාරකයක් ලෙස යොදාගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**3. පද්ධති හා පාලන.**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු ආයතනයේ සභාපතිවරයා වෙත වරින්වර දන්වා යවන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුවේ.

(අ) ගිණුම්කරණය
(ආ) සැලැස්ම සකස් කිරීම
(ඇ) පාඨමාලා පැවැත්වීම
(ඈ) පොත්පත් පවතවාගෙන යාම